**ඇඹිලිපිටිය නගර සභාව**
**රත්නපුර දිස්ත්‍රික්කය**
**-------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

-----------------

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

------------------------------

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 මාර්තු 13 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව හා විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2020 ජූනි 24 දින සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

---------------------------

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට ඇඹිලිපිටිය නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

------------------------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට ඉඩම් හා ගොඩනැගිලි රු. 23,000,000 ක් වැඩියෙන් දක්වා තිබුණි. | ඉඩම් ගොඩනැගිලි වටිනාකම නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. |
| (ආ) | සමාලෝචිත වර්ෂය තුල ක්‍රියාත්මක කල පිරිවැය රු. 5,497,843 ක් වූ කර්මාන්ත ප්‍රාග්ධනිත කර නොතිබුණි. | අදාල කර්මාන්තවල පිරිවැය ප්‍රාග්ධනිත කළ යුතුවේ. | අදාල කර්මාන්ත ප්‍රාග්ධනිත කිරීමට කටයුතු කරන බව දන්වමි. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය අවසාන දිනට යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ වටිනාකම රු. 1,577,685 ක් අඩුවෙන් දක්වා තිබුණි. | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ වටිනාකම නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. |
| (ඈ) | වැය විෂයයන් 03 කට අදාලව පුනරාවර්තන වියදම රු. 538,034 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | වර්ෂයට අදාල වියදම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුවේ. | ඊළඟ වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. |
| (ඉ) | පළාත් සභා ප්‍රතිපාදන මත ක්‍රියාත්මක කල කර්මාන්ත 07 කට අදාලව ලැබිය යුතු හා කොන්ත්‍රාත්කරුවන් වෙත ගෙවිය යුතු රු. 6,801,015 ක් ගිණුම්ගත කර නොතිබුණි. | වර්ෂයට අදාල ආදායම් හා වියදම් නිවැරදිව හඳුනාගෙන ගිණුම් පිළියෙල කළ යුතුවේ. | ගිණුම්කරණමය සටහන් තැබීමේ වරදක් සිදු වී ඇති බව පිළිගනිමි. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | සමාලෝචිත වර්ෂයට අදාල ස්ථාවර තැන්පතු පොළිය රු. 111,033 ක් අඩුවෙන් දැක්වුණි. | වර්ෂයට අදාල තැන්පත් පොළිය නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | ඊළඟ වසරේ මූල්‍යා ප්‍රකාශන සකස් කිරීමේ දී නිවැරදි කරන බව දන්වමි. |
| (උ) | සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායකවීමේ ගිණුම් ශේෂය සහ ස්ථාවර වත්කම් ශේෂය අතර රු. 2,658,780 ක වෙනසක් පැවතුණි. | ජංගම නොවන වත්කම් ශේෂය හා ප්‍රාග්ධන යෙදුමට ආදායමෙන් දායක ගිණුමේ ශේෂය සැසඳිය යුතුවේ. | ඊළඟ වර්ෂයේ නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. |

**1.4 අනුකූල නොවීම**

--------------------

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම**

----------------------------------------------------------------------------------------

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම් | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 371(2) ඇ | 2007 වර්ෂයේ සිට 2010 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදය තුල අවස්ථා 06 කදී ලබාදී තිබූ රු. 400,725 ක් වූ අත්තිකාරම් පියවීමට කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | අදාල පාර්ශවයන් දැනුවත්කර තිබුණද, අත්තිකාරම් පියවා ගැනීමට නොහැකි වී ඇති බව දන්වමි. |
| (ආ) | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | | | |
| | (i) 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන චක්‍රලේඛයේ 3.1 ඡේදය | සභාව සතු වාහන 04 ක ඉන්ධන දහන පරීක්ෂාව සිදුකර නොතිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව ඉන්ධන දහන පරීක්ෂාව සිදුකළ යුතුවේ. | අදාල වාහනවල ඉන්ධන පරික්ෂාව කඩිනමින් සිදු කිරීමට නියමිත බව දන්වමි. |
| | (ii) 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන චක්‍රලේඛය | කාර්යය මණ්ඩලය සඳහා වාර්ෂිකව අත්සන් කලයුතු කාර්යසාධන ගිවිසුම් අත්සන් කර නොතිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කාර්යසාධන ගිවිසුම් අත්සන් කළ යුතුවේ. | 2020 වසර සඳහා කාර්යසාධන ගිවිසුම් අත්සන් කිරීමට කටයුතු කරන බව දන්වමි. |
| (ඇ) | 2017 ජූලි 25 දිනැති අංක 02/2017 දරන ජාතික අයවැය චක්‍රලේඛය | ආයතනික කාර්යයභාරයේ නිමවුමට අදාල නිමවුම් දර්ශක හා ප්‍රධාන කාර්යසාධන දර්ශක හඳුනාගෙන නොතිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව අදාල දර්ශක හඳුනාගැනීමට කළ යුතුවේ. | ඉදිරියේදී අදාළ දර්ශක සකස් කිරීමට කටයුතු කරමි. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | 2018 ජුලි 19 දිනැති අංක 2018/ඉ-පළාත් පාලන 01 දරන පළාත් පාලන චක්‍රලේඛය | සේවාලාභියාට අන්තර්ජාලය හරහා සේවාවන් අයදුම් කිරීමේ අවස්ථාව සලසාදීම සඳහා අවශ්‍ය පහසුකම් ස්ථාපිත කිරීමට සභාව අපොහොසත්ව තිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කරමින් සේවාලාභියාට අවශ්‍ය පහසුකම් ලබාදීමට කටයුතු කළ යුතුවේ. | එකඟ වෙමි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 27,453,244 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 25,500,993 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2019 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 17,958,000 | 18,301,926 | 14,249,837 | 44,848,833 | 18,056,000 | 17,749,272 | 17,749,272 | 41,072,688 |
| කුලී | 21,540,500 | 17,863,155 | 16,738,903 | 9,889,337 | 14,252,200 | 15,312,341 | 15,312,344 | 8,270,985 |
| බලපත්‍ර ගාස්තු | 3,582,000 | 3,044,889 | 2,412,339 | 201,500 | 2,022,800 | 2,523,479 | 2,523,479 | - |
| වෙනත් ආදායම් | 16,891,700 | 19,024,056 | 33,892,664 | 4,569,928 | 11,019,700 | 13,285,992 | 13,285,992 | 7,497,459 |
| | 59,972,200 | 58,234,026 | 67,293,743 | 59,509,598 | 45,350,700 | 48,871,084 | 48,871,087 | 56,841,132 |

#### 2.2.2 වරිපනම් හා බදු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසාන දිනට රු. 44,848,833 ක් වූ හිඟ වරිපනම් ශේෂය තුල වසර 05 ට වඩා වැඩි කාලයක සිට පැවතඑන එකතුව රු. 38,807,096 ක් පැවතුණි. එම හිඟ ශේෂ අයකර ගැනීම සඳහා නගර සභා ආඥා පනතේ 170 වගන්තිය ප්‍රකාරව සභාව කටයුතු කර නොතිබුණි. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | හිඟ බදු මුදල් අයකර ගැනීමට කටයුතු කරන බව දන්වමි. |

## 2.2.3 වෙනත් ආදායම්

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය අවසාන දිනට රු. 3,194,281 ක් වූ පොදු වෙළඳපල හිඟ කඩකුළී ශේෂය තුල වසර 05 ට වඩා වැඩි කාලයක සිට පැවත එන රු.2,354,625 ක් ඇතුලත් වී තිබුණි. එම හිඟ කුළී අයකර ගැනීමට සභාව ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | අයකරගත නොහැකි හිඟ ආදායම් සම්බන්ධයෙන් නීතිමය පියවර ගත යුතුවේ. | ඉදිරියේදී අයකර ගැනීමට කටයුතු කරන බව දන්වමි. |
| (ආ) | සමාලෝචිත වර්ෂය අවසාන දිනට රු. 2,451,402 ක් වූ බස්නැවතුම්පල හිඟ කඩකුළී හා රු. 3,374,350 ක් වූ වෙළඳ ස්ථාන හිඟ කුළී අයකර ගැනීමට සභාව අපොහොසත්ව තිබුණි. | අයකරගත නොහැකි හිඟ ආදායම් සම්බන්ධයෙන් නීතිමය පියවර ගත යුතුවේ. | හිඟ කඩකුළී නොගෙවන කඩ මුද්‍රා තැබීමට කටයුතු කරන බවට දැනුවත් කිරීමෙන් පසුව මාසිකව රු. 10,000 බැගින් හිඟ පියවීමට එකඟ වී ඇති බවත් ඒ අනුව එක් මසක හිඟ කඩකුළී අයවී ඇති බවත් දන්වමි. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

#### (අ) ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම හා අයවැය ලේඛනය තුල ඇතුලත් සංවර්ධන කාර්යයන් 44 කින් කාර්යයන් 18 ක් ඉටුකර නොතිබූ අතර, සැලැස්මට ඇතුලත් නොවූ එකතුව රු. 26,255,324 ක් වූ සංවර්ධන කාර්යයන් 28 ක් ඉටුකර තිබුණි. | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම හා අයවැය ඵලදායී මූල්‍ය පාලන කාරකයක් ලෙස උපයෝගී කරගත යුතුවේ. | වාර්ෂික අයවැය සඳහා මහජන නියෝජිතයන් විසින් ලබාදෙන සංවර්ධන යෝජනා මහා සභාවන්වල දී වෙනස් කර වෙනත් යෝජනාවන් ඒ වෙනුවට නම්කර ක්‍රියාත්මක කිරීම අනුමත කර ගන්නා බවත් ඉදිරියේදී මේ සම්බන්ධව අදාළ මහජන නියෝජිතයින් දැනුවත් කිරීමට කටයුතු කරන බවත් දන්වමි. |

(ආ) **තිරසර සංවර්ධන ඉලක්ක**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් වූ 2030 න්‍යාය පත්‍රය පිළිබඳව සභාව දැනුවත්ව සිටියද එම අරමුණු සඳහා වන ගෝලීය දර්ශක තුළින් සහා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නංවාලීම සඳහා වන දිගුකාලීන සැලසුම් 2019 දෙසැම්බර් වනවිටත් සකස් කර නොතිබුණි. | තිරසර සංවර්ධන සැලසුම් සකස් කර ක්‍රියාත්මක කළ යුතුවේ. | 2020 වර්ෂය සඳහා සැලැසුම් සකස් කිරීමට කටයුතු කරන බව දන්වමි. |

**3.2 මානව සම්පත් කළමනාකරණය**

**සේවක පුරප්පාඩු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව සතුව වාහන 18 ක් පැවතියද, අනුමත රියදුරු සංඛ්‍යාව 06 ක් විය. සභාවේ අවශ්‍යතාවයට ගැලපෙන පරිදි රියදුරු තනතුරු ගණන අනුමත කර නොතිබීම හේතුවෙන් කම්කරු තනතුර සඳහා බඳවාගෙන තිබූ සේවකයින් 06 දෙනෙකු රියදුරු තනතුරුවල සේවයේ යොදවා තිබුණි. | සභාවේ අවශ්‍යතාවයට ගැලපෙන පරිදි රියදුරු තනතුරු අනුමත කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | මේ සම්බන්ධයෙන් කටයුතු කළ නමුදු රියදුරු සංඛ්‍යාව අනුමත නොවූ බැවින් හා සභාවේ කාර්යයන් අනිවාර්යෙන් කළයුතු බැවින් කම්කරුවන් හෝ යොදා ගෙන එම කාර්යන් සිදුකරනු ලබන දන්වමි. |

**3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2019 මාර්තු හා අප්‍රේල් මාසවල හඳුනාගෙන තිබූ අනවසර ඉදිකිරීම් 35 කින් 32 ක් දින 07 ක් තුල ඉවත් කර ගන්නා ලෙස අදාල පාර්ශව වෙත ලිඛිත දැනුම්දීම් පමණක් සිදුකර තිබුණි. ඉවත් නොකරන ලද අනවසර ඉදිකිරීම් සම්බන්ධයෙන් නීතිමය කටයුතු කිරීම සභාව විසින් ප්‍රතික්ෂේප කර තිබුණි. | අනවසර ඉදිකිරීම් හඳුනාගැනීම, ඒවා ඉවත් කිරීම හෝ නියමානුකූල කිරීම සිදුකළ යුතුවේ. | විගණන නිරීක්ෂණ හා එකඟ වෙමි. |

## 3.4 වත්කම් කළමනාකරණය

### 3.4.1 වත්කම් ලේඛනගත නොකිරීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මූලා ප්‍රකාශන වලට ඇතුලත් කර තිබූ එකතුව රු. 34,773,350 ක් වූ ඉඩම් හා ගොඩනැගිලි වත්කම් ලේඛනයට ඇතුලත් කර නොතිබුණි. | වත්කම් ලේඛන යාවත්කාලීනව නඩත්තු කළ යුතුවේ. | වත්කම් ලේඛන නිවැරදිව යාවත්කාලීන කර පවත්වා ගෙන යාමට විෂයයභාර නිළධාරියාට උපදෙස් දෙන බව දන්වමි. |

### 3.4.2 නඩත්තු හා අළුත්වැඩියා සිදු නොකිරීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව සතු ගලි බවුසරය 2016 සැප්තැම්බර් සිට ක්‍රියාවිරහිතව පැවතියද, සමාලෝචිත වර්ෂය අවසන් වනවිටත් අළුත්වැඩියා කර නොතිබුණු අතර, එහි අයිතිය සභාව වෙත පවරා ගැනීමට ද අපොහොසත් වී තිබුණි. | අයිතිය සම්බන්ධ ගැටළු නිරාකරණය කරගෙන අළුත්වැඩියා කිරීමට හෝ අපහරණය කිරීමට කටයුතු කළ යුතුවේ. | බවුසරයේ ලියාපදිංචි හිමිකරු සොයාගැනීම දුෂ්කර වී ඇති බවත්, මෙම බවුසරය අයත්වන මාදිලියේ අමතර කොටස් දුලභ බැවින් අළුත්වැඩියා කිරීම ද අසීරුවී ඇති බවත් දන්වමි. |

## 3.5 අවිධිමත් ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභා භූමිය, සතිපොළ භූමිය සහ කසළ අංගනයේ ආරක්ෂක කටයුතු භාර ස්ථාන භාර නිලධාරියා විසින් 2018 සැප්තැම්බර් සිට 2019 මැයි දක්වා කාලපරිච්ඡේදය තුල රාත්‍රී අධීක්ෂණ කටයුතු සිදුකර නොතිබියදී එම කාර්යය වෙනුවෙන් රු. 262,493 ක් ගෙවා තිබුණි. | ඉටු නොකරන ලද රාජකාරී සඳහා ගෙවා ඇති මුදල් ආපසු අයකරගත යුතුවේ. | ගිවිසුම් ඇප තැන්පතු වලින් එම මුදල් අයකර ගැනීමට කටයුතු කරන බව දන්වමි. |

**3.6 ප්‍රසම්පාදනය**

**කොන්ත්‍රාත් පරිපාලනය**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | මහනැඟුම ග්‍රාමීය සංවර්ධන වැඩසටහන 2010 යටතේ ලද රු. 2,500,000 ක ප්‍රතිපාදන මත ඇඹිලිපිටිය ජනාධිපති විද්‍යාලය ඉදිරිපිට මාර්ගය අදියර 05 ක් යටතේ සංවර්ධනය කිරීම සඳහා ගොවි සංවිධානයක් සමඟ 2010 ජූනි 24 දින ගිවිසුම්ගත වී එකතුව රු. 531,567 ක් අත්තිකාරම් වශයෙන් සහා අරමුදලින් ගෙවීම් කර තිබුණි. අදාල ඉදිකිරීම් නියමිත ප්‍රමිතියෙන් තොරව සිදුකර තිබීම හේතුවෙන් උක්ත වැඩසටහන යටතේ නගර සභාවට ලැබිය යුතුව තිබූ මුදල් නොලැබීම නිසා ගෙවන ලද අත්තිකාරම් පියවා ගැනීමට නොහැකි වී තිබුණි. | වගකිව යුතු පාර්ශව සම්බන්ධයෙන් කටයුතු කළ යුතුවේ. | මෙතෙක් පියවා ගැනීමට නොහැකි වී ඇති බව දන්වමි. |
| (ආ) | ඇස්තමේන්තුගත පිරිවැය රු.1,336,411 ක් වූ කොඩිකන්ද දෙවන පටුමග කොන්ක්‍රීට් කිරීමේ කර්මාන්තයේ නොකරන ලද වැඩ සඳහා රු. 57,506 ක් ගෙවා තිබුණි. | වැඩිපුර ගෙවීම් අයකර ගත යුතුවේ. | වැඩිපුර ගෙවීම් ආපසු අයකර ගැනීමට කටයුතු කරමි. |

**4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**නොවිසඳී ඇති නිරීක්ෂණ**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ඇඹිලිපිටිය නගර මධ්‍යයේ පිහිටි ඔරලෝසු කණුවේ ඔරලෝසුව අළුත්වැඩියාව ප්‍රසම්පාදන විධිවිධාන වලින් බැහැරව ඇස්තමේන්තු පිරිවැය වූ රු. 247,640 කට පුද්ගලයෙකු වෙත පවරා තිබුණි. ලිඛිත ගිවිසුමක් හෝ සුරක්ෂණයක් නොමැතිව 2017 මැයි 05 දින රු. 150,000 ක අත්තිකාරමක් ලබාදී තිබුණද, අළුත්වැඩියාව නිසි පරිදි සිදුකර නොතිබීම හේතුවෙන් ඔරලෝසුව අක්‍රීයව පැවතුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ වල සඳහන් විධිවිධාන අනුගමනය කළ යුතුවේ. | එකඟ වෙමි. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ඇඹිලිපිටිය බස් නැවතුම්පලින් 2014 වර්ෂයේ සිට බස් රථ ගාල් කිරීමේ ගාස්තු අයකර ගැනීමට සභාව අපොහොසත්ව තිබුණි. | සභාවට අයවිය යුතු ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | මගී ප්‍රවාහන අධිකාරිය සමඟ ඇතිවූ ගැටළුකාරී තත්ත්වයක් මත ආදායම අහිමි වූ බවත් මේ වනවිට එම ආදායම් අයකර ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතින බවත් දන්වමි. |
| (ඇ) | හිඟ වරිපනම් එකතු කරන නිලධාරියාට 2014 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා රු. 237,012 ක කොමිස් මුදලක් වැඩිපුර ගෙවා තිබුණු අතර, ඉන් රු. 142,743 ක් ආපසු අය කරගත යුතුව පැවතුණි. | වැඩිපුර ගෙවා ඇති මුදල් කඩිනමින් අයකරගත යුතුවේ. | වී. ලොකුවිතාන මයා වෙත ගෙවා ඇති වැඩිපුර ගෙවීම් අයකර ගැනීම සඳහා අවසාන දැනුම්දීමද සිදුකර ඇති නමුත් මේවන තෙක් එම ගෙවීම් ඔහු විසින් පැහැර හරිමින් පවතින බව දන්වමි. |
| (ඈ) | වරිපනම් බදු අයකිරීම සඳහා සභා බල ප්‍රදේශයේ සියළු නිශ්චල දේපල වර්ෂ 05 කට වරක් තක්සේරු කල යුතු වුවත්, 2012 වර්ෂයෙන් පසුව දේපල තක්සේරුවක් සිදුකර නොතිබුණි. | වසර 05 කට වරක් දේපල තක්සේරු කළ යුතුවේ. | මේ සඳහා තක්සේරු දෙපාර්තමේන්තුව වෙත කිහිපවරක් ලිඛිතව ඉල්ලුම් කර ඇති බවත්, ඒ අනුව වරිපනම් තක්සේරුව ඉදිරි කාලය තුළ සිදු කිරීමට භාරගෙන ඇති බවත්, දන්වමි. |